# 7 වන දවස

## ස්වර්ගයේ වැඩ සිටින අපගේ පියාණෙනි

අපගේ පියාණෙනි ක්‍රිස්තියානි යාච්ඤාවේ දී අපි ආමන්ත්‍රණය කරන්නේ අපගේ ආදර අබ්බා පියාට ය. මෙම ආමන්ත්‍රණයෙන් පෙනෙන්නේ ආදර දරුවන් පිරිසක් තමනට ඉතා සමීප පියාට කතා කරන ස්වරූපයයි. ''**අපගේ**'' යන්නෙන් සාංඝික ලක්ෂණයක් පිළිබිඹු වේ. එකම පියාගේ දරුවන් හැටියට අපි එකිනෙකා අතර ද තිබිය යුතු සාංඝිකකම ගැන මෙයින් අපට ඉඟියක් ලැබේ. ක්‍රිස්තියානි අප දෙවිඳුන්ට 'අපගේ පියාණෙනි' කියා අමතන විට පවුලක් හැටියට දෙවිඳුන්ට ඇති සම්බන්ධතාවය ප්‍රකාශ වෙයි. දෙවියන් වහන්සේ අප හැමගේ ම පියාණෝ වෙති. එමනිසා සෑම මනුෂ්‍යයෙක් ම මාගේ සහෝදරයා ය - සහෝදරිය. ඔවුන් සමඟද දෙවිඳාණෝ වැඩ වසන සේක. සෑම මනුෂ්‍යයෙකුට ම ගෞරව කිරීම, සැලකීම සහ ආදරය, කරුණාව දැක්වීම දෙවියන් වහන්සේට ම කරන ගෞරවයකි, ආදරයකි. **''දෙවියන් වහන්සේට ප්‍රේම කරන තැනැත්තා තම සහෝදරයාටත් ප්‍රේම කළ යුතු ය යන ආඥාව අපි ඔවුන් වහන්සේගෙන් ලැබීමු''** (1 ජොහාන් 4:21).

**දවස පුරා :-**

✵ අද දවස පුරා ඔබට මුණ ගැසෙන සහ ඔබ දකින අය තුළ ''දේව තාත්තා වැඩ සිටින සේක'' යන සත්‍යයට අවදි වන්න. සෑම කෙනෙක් ම දේව දරුවන් හැටියට දකින්න. ඔවුන්ට ගෞරව කරන්න. පුබුදුවට සම්බන්ධ කෙනෙකු ව මුණ ගැසුනොත් ''ෂාලොම්'' කියා ප්‍රාර්ථනා කරන්න.

✵ පුබුදු ගීතාංජලී ගී අංක 12